ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2019 ජුලි

கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 செப்டம்பர்

Genaral Certificate of Education (Ord. Level) Examination, July 2019

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලු සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. කොළඹ ට නුදුරු ඉතා සුන්දර ග්‍රාමයක වැවක් දක්නට ඇත. කොළඹට නුදුරු මෙවන් ප්‍රදේශයක එතරම් ලස්සන වැවක් ඇත්දැයි සිතීම අසීරු කරුණකි. මෙහි දිය නෑමෙන් විනෝද වීමට සති අන්තයේ විශාල පිරිසකුත් සතියේ දිනවල යම් පිරිසකුත් නොකඩවා පැමිණේ.

සුදත් විමලවීර, ඉංගිරිය මහජන බැංකුවේ ජංගම ගිණුමක් පවත්වාගෙන යන ඉතා විශ්වාසවන්ත ගනුදෙනුකරුවෙකි. බැංකුවේ ස්වයං රැකියා ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය යටතේ රු. 200,000ක ණය මුදලක් ලබා ගෙන 2018.01.01 දින "රජ බොජුන්" නමින් බොජුන් හලක් ආරම්භ කළේ ය. සාධාරණ මිලකට පිරිසිදු ආහාර වේලක් සහ කෙටි කෑම වර්ග සැපයීම ඔහුගේ අරමුණ විය.

තවද 2018.01.01 දින ආරම්භ කළ ඔහුගේ ඔහුගේ ව්‍යාපාරය සඳහා තමා ඉතිරි කර ගෙන තිබු රු. 120,000 ක් හා රු. 300,000ක් වටිනා ගොඩනැගිල්ල ද යෙදවී ය. ඔහුගේ උනන්දුව හා පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භයේ ව්‍යාපාරයට හොඳ ඉල්ලුමක් පැවතිය හ. මේ සඳහා ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ ද සහයෝගය ලැබිණි.

ඔහුගේ මෙම ව්‍යාපාරය සඳහා පළමු මාසයේ පහත වියදම් දිරීමට සිදුවිය.

| | |
|---|---|
| ආහාර සඳහා | රු. 50,000 |
| විදුලිය | රු. 10,200 |
| ජල බිල්පත | රු. 7,100 |
| ප්‍රචාරණය | රු. 2,300 |

එහෙත් ඔහු මාසය අවසානයේ රු. 210,000 ක ආදායමක් ලබා ගන්නා ලදි.

i. මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද?

ii. ඔහුගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද ? ඒ ඇයි ?

iii. මෙම ව්‍යාපාරයේ අළෙවි කළ හැකි වෙනත් භාණ්ඩ වර්ග මොනවා ද?

iv. මෙම ව්‍යාපාරය කුමන වෙළෙඳාමක් ලෙස සැලකිය හැකි ද? එහි ලක්ෂණයක් නම් කරන්න.

v. මෙම ව්‍යාපාරය ඇරඹිමේ දි ඇති වු මූලික ගිණුම් සමීකරණයේ ගනුදෙනු වටිනාකම් සහිතව ලියන්න.

vi. 2018.01.01 දින මුළු වත්කම් ප්‍රමාණය කොපමණ ද?

vii. මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම කොපමණද ?

viii. 2018.01.01 දින ආරම්භ කළ මෙම ව්‍යාපාරයේ සිදු වු එම සිද්ධීන් වාර්තා කළ යුතු මුලික පොත නම් කරන්න.

ix. සුදත් විමලවීර මහතා විසින් ලබා ගත් බැංකු ණය කුමන ගිණුම්කරණ මූලර්මයකට අයත් වේ ද?

x. "රජ බොජුන්" ජනවාරි මාසයේ ලාභය කීයද ?

*(ලකුණු 02 x 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

02. i. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් ව්‍යාපාරික දුර්වලතාවක් හා බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් අවස්ථාවක් නම් කරන්න

ii. කුඩා පරිමාණයේ තේ කොළ පැකට්කර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය සජිත්, ව්‍යාපාරය පුළුල් කිරීමට අදහස් කර නයනජිත් ව්‍යාපාරයට බඳවා ගනී. නව ව්‍යාපාරය තුළින් අයත්වන ප්‍රතිලාභ 2 ක් සඳහන් කරන්න.

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.
- ❖ ප්‍රාග්ධනය නිෂ්පාදන සාධකයකි.
- ❖ විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමකි.
- ❖ ජාත්‍යන්තර වෙළෙඳ සම්බාධක පැනවීම ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයෙන් ලැබෙන තර්ජනයකි.
- ❖ දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදී යාම, ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර ලෙස බලපායි.

iv. අ. රාජ්‍ය දෙපාර්තමේන්තුවක වාසි දෙකක් සඳහන් කරන්න.
ආ. රාජ්‍ය සංස්ථා හඳුනා ගත් හැකි තවත් නම් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 08 යි)

03. i. "සෑම ව්‍යාපාරයකම මූලික අරමුණ ලාභ ලැබීම ය."මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ii. ව්‍යපාරයක අරමුණු ඉටුකර ගැනීමේ දී ව්‍යාපාරයකට ඇති විය හැකි විවිධ ඉලක්කයන් හෙවත් උප අරමුණු 2ක් නම් කරන්න.

iii. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කරන්න.
- ❖ ව්‍යාපාර කටයුතු සඳහා උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මැති පාර්ශව ලෙස හඳුන්වයි.
- ❖ ගණකාධිකාරිවරු, නීතඥයින්, බදු නිලධාරින් හා වෛද්‍යවරු වැනි වෘත්තීන් වල යෙදී සිටින අය බොහෝ විට ආරම්භ කරනුයේ හවුල් ව්‍යාපාර ය.
- ❖ "සයුර සහ ප්‍රතුයෝ" හවුල් ව්‍යාපාරයකට නිදසුනක් වේ.
- ❖ ඒක පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර දින 21 ක් ඇතුළත ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමට අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

iv. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අත්කර ගත හැකි ප්‍රයෝජන මොනවා ද?

(ලකුණු 08 යි)

## II කොටස - ගිණුම්කරණය

**(ප්‍රශ්ණ සියල්ලට ම පිළිතුරු සපයන්න.)**

04. i. ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවි කරන මයුරගේ ව්‍යාපාරයේ 2019.01.31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

01. රු. 100,000 ප්‍රාග්ධනයක් යෙදවීම.
02. රු. 80,000 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ණයට ගැනීම
03. රු. 30,000ක් ණයහිමියන්ට ගෙවීම
04. රු. 15,000 ක ගොඩනැගිලි ද්‍රව්‍ය රු. 20,000 ක අත්පිට මුදලට විකිණීම.
05. මයුර පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 10,000 ක ව්‍යාපාරයෙන් ගැනීම

**අවශ්‍ය වන්නේ,**

ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

| ගනු දෙනුව | වත්කම් | | | හිමිකම් + | වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණයහිමියෝ |
| 2019 01/01 | 120,000 | 80,000 | 40,000 | 160,000 | 50,000 | 30,000 |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |

2019.01.31 දිනට ව්‍යාපාරයේ පහත සඳහන් අයිතම් වල අගය සොයන්න.

01. ජංගම නොවන වත්කම් 02. ජංගම වත්කම් 03. ජංගම නොවන වගකීම්
04. ජංගම වගකීම් 05. අයිතිකරුගේ හිමිකම

ii. පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

1. ප්‍රාග්ධනය යෙදුවා රු. 200,000
2. ණයට භාණ්ඩ ගත්තා රු. 56,000
3. අයිතිකරු රු.20,000ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා.
4. ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 15,000 යි.
5. අත්පිට විකුණුම් රු. 44,000
6. රු. 50,000 ක බැංකු ණයක් ගත්තා.
7. විදුලි බිල ගෙව්වා රු. 6,200 යි. (ලකුණු 12 යි)

05. පහත සඳහන් ගනුදෙනු ඇසුරෙන් මුදල් පොතක් පිළියෙළ කර ලෙජර් ගිණුම් පෙන්වන්න. (ලෙජර් ගිණුම් තුලනය කිරීම අනිවාර්ය වේ.)

03/01 ප්‍රාග්ධනය යෙදුවා රු. 125,000

03/04 අත්පිට ගැණුම් රු. 32,000

03/06 විදුලි බිල ගෙව්වා රු. 5,000

03/09 රමල් ට ගෙව්වා රු. 9,800 (වට්ටම රු. 200)

03/14 අත්පිට ගැණුම් රු. 62,100 යි.

03/18 රක්ෂණය ගෙව්වා රු. 11,500

03/22 සුමල්ගෙන් මුදල් ලැබුණා රු. 6,600 (වට්ටම රු. 400)

03/27 ගෙවල්කුලී ලැබුණා රු. 8,000 යි.

03/30 කමල් ට ගෙවිය යුතු රු. 5,000 ගෙවීමේ දී 10% වට්ටමක් ලැබුණා. (ලකුණු 12 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.